# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/37 - 2014 මැයි මස 28 වැනි බදාදා - 2014.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්පත් කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය* : 10/3/1/3/60.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2013/ VE/153.

ගම් පුළුල් කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 29 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :* -

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ පල්ලේසිය සුළු කොට්ඨාසයේ, ඉකිරිගොල්ල ග්‍රාම නිලධාරී වසමේ, ඕවල ගමේ පිහිටි මාතලේ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් සහතික කරන ලද මා. 1618 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත විස්තර සඳහන් ඉඩම් කට්ටිය.

**කැබලි අංක 1**

ඉඩමේ නම: විහාරගම වත්ත; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: වාරියපොල ගෲප්, වාරියපොල, මාතලේ; ප්‍රමාණය: හෙක්ටයාර් 4.0469

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2014 අගෝස්තු මස 27 වැනි දින පෙ. ව. 10.00 ට රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 අගෝස්තු මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ඊ. ඩබ්. එන්. ඒ. එගොඩවෙල,
ප්‍රාදේශීය ලේකම් (වැ. බ.),
රත්තොට.

2014 මැයි මස 20 වැනි දින,
රත්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 300


1A - G 19625 - 70 - (2014/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.